# UNIVERSITY OF PERADENIYA
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION

**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය 2019**

**(2019 )**

**ඉතිහාසය VII (HG 7)**

**පොදු රාජ්‍ය මණ්ඩලයේ ඉතිහාසය**

කාලය පැය 03 යි.

**එක්** කොටසකින් යටත් පිරිසෙයින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුර දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළහ (12) කි.

---

### පළමුවැනි කොටස

1. "ටියුඩර් යුගය තුළදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පදනම දමන ලදි." පරීක්ෂා කරන්න.
2. බ්‍රිතාන්‍ය යටත්විජිත ක්‍රියාවලියේදී පළමුවන එළිසබත් රැජිණගේ කාර්යභාරයේ ඇති වැදගත්කම පහදන්න.
3. 15 වැනි හා 16 වැනි සියවස්වල බ්‍රිතාන්‍ය දේශ ගවේශන ව්‍යාපාරය සඳහා යොමු කළ සාධක සාකච්ඡා කරන්න.
4. ඇමෙරිකානු විප්ලවයේ වැදගත්කම විභාග කරන්න.

### දෙවැනි කොටස

5. දහනවවැනි සියවසේ අවසාන භාගයේදී ඇති වූ "නව අධිරාජ්‍යවාදයේ" නව්‍යතම ලක්ෂණ විමසන්න.
6. 1688 ඉංග්‍රීසි විප්ලවයේ ඓතිහාසික වැදගත්කම පිරික්සන්න.
7. මහා බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය තුළින් ජනිත වූ සමාජ හා දේශපාලන ප්‍රතිඵල කවරේද?
8. ඕස්ට්‍රේලියානු ජනපදකරණය සම්බන්ධයෙන් එඩ්වඩ් ගිබන් වේක්ෆීල්ගේ මෙහෙය විස්තර කරන්න.

## තුන්වන කොටස

9. ඩොමීනියන් තත්ත්වය පිළිබඳ සංකල්පයෙහි වර්ධනයේ ප්‍රධාන අවස්ථා පැහැදිලි කරන්න.

10. 1900 සිට 1947 දක්වා කාලය තුළදී ඉන්දියානු ජාතිකවාදී ව්‍යාපාරයේ වර්ධනයන් දක්වන්න.

11. ආසියාවේ යටත්විජිත විරෝධී ව්‍යාපාරයන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට සිදු කළ බලපෑම කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ලුහුඬු ඓතිහාසික සටහන් ලියන්න.

I වහල් විරෝධී ව්‍යාපාරය
II මුද්දර පනත
III 1926 අධිරාජ්‍ය සමුළුව
IV සූවස් ඇළ